සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2011 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,824 - 2013 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2013.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1238 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1248 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 සැප්තැම්බර් මස 16 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ජූලි මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ තලාපිටිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

08-462

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 සැප්තැම්බර් මස 16 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ජූලි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අම්පාර | ඉරක්කාමම් | අම්පාර දිස්ත්‍රික්කයේ සම්මන්තුරපත්තුව කොට්ඨාසයේ (10ඒ, 11ඒ ගම්) මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |

08-471

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මුලතිව් දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 සැප්තැම්බර් මස 23 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 අගෝස්තු මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මුලතිවු | ඔඩ්ඩුසුඩාන් | කට්සිලයිමඩු කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ හා ඔඩ්ඩුසුඩාන් කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිවු. |

08-631

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසයේ ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 සැප්තැම්බර් මස 23 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 අගෝස්තු මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | රුවන්වැල්ල | කෝරළතුන හා පාතබුලත්ගම කොට්ඨාසයේ කන්නත්තොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

08-630

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 සැප්තැම්බර් මස 16 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ජූලි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | අක්කරපත්තුව | අම්පාර දිස්ත්‍රික්කයේ කරුන්කොඩිතිව් කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |
| අම්පාර | පොතුවිල් | අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |

08-472

## ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ කාර්මික නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවීම

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් විසින් පිළියෙල කරගත් අයදුම්පත් "ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, විද්‍යා මාවත, කොළඹ 07" යන ලිපිනයට 2013.09.16 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "කාර්මික නිලධාරි තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

02. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රු. 15,005-4x180-6 x 240-11 x 320-20 x 360=රු. 27,885 ක් වේ.

03. සුදුසුකම් :

III ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා පහත I හා II සඳහන් මූලික සුදුසුකම් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය. :-

I *අධ්‍යාපන සුදුසුකම් :*

අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම, සහ

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ භෞතික විද්‍යාව විෂයය සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන් යටතේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම.).

II *වෘත්තීය සුදුසුකම් :*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (05) මට්ටමේ කුසලතා ලබා තිබීම, හෝ

* මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

* ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

* උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

* ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වැනි කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම;

*හෝ*

* උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස්

ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමානයයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

04. *පළපුරුද්ද :*
ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

05. *වයස් සීමාව :*
අයදුම්පත් බාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 30ට නොවැඩි විය යුතුය.

06. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*
ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් මගිනි.

මූලික සුදුසුකම් සපුරා ඇති හා සම්මුඛ පරීක්‍ෂණයෙන් උපරිම ලකුණු ලබාගත් අයදුම්කරු බඳවා ගනු ලැබේ.

07. *වෙනත් :*

ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

එස්. එම්. මොහොමඩ්,
ලේකම්,
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය.

08-513

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන්හි ඉඳුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්‍ෂකයින් සඳහා පුරප්පාඩු පවතී. :-

(අ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව;
(ආ) වෛද්‍ය ශාඛාව;
(ඇ) පාලන වෛද්‍ය ශාඛාව;
(ඈ) දන්ත වෛද්‍ය ශාඛාව;
(ඉ) පාලන නීති ශාඛාව.

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්‍ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව :
සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරුවන් - පිරිමි (නිත්‍ය) :

* *ප්ලයිට් ලෙප්ටිනන්ට්.*—සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

* ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය සඳහා ඉගෙනුම ලබන පළමු සහ දෙවන කොටස් සම්පූර්ණ කර දැනට තුන්වන කොටසේ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්‍ෂාවෙන් සිටින සිසුන්ට ද මේ සඳහා අයදුම් කළ හැකි අතර ඔවුන් ෆ්ලයින් ඔෆිසර් නිලයට බඳවාගනු ලැබේ. උපාධි පාඨමාලාව හොඳින් සම්පූර්ණ කර ඇති බව සහ උපාධි ප්‍රධානෝත්සවයට පෙනී සිටීමට සුදානමින් සිටින බව සනාථ කරන සහතිකයක් අදාල විශ්වවිද්‍යාලයෙන් ලබා ගත් පසුව ප්ලයිට් ලෙප්ටිනන්ට් නිලය ලබාදෙනු ලැබේ.

* *ෆ්ලයින් ඔෆිසර්.*—සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී.)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්.)/උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර තුනකට (3) නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම.

* *පයිලට් ඔෆිසර්.*—සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී.)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්.)/උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර තුනකට (3) අඩු පලපුරුද්දක් ලබා තිබීම.

*ද්‍රව්‍ය ඉංජිනේරු නිලධාරීන් (තාර යන්ත්‍රෝපකරණ සඳහා)* - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)

* *ප්ලයිට් ලෙප්ටිනන්ට්.*— සිවිල් ඉංජිනේරු හෝ ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සමග උපාධි සුදුසුකම්වලින් පසුව මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන තාර මිශ්‍රණ යන්ත්‍ර පිළිබඳව සහ තාර මිශ්‍රණ තත්ව පරීක්‍ෂණ පිළිබඳව අවම වශයෙන් වසරක (1) පලපුරුද්දක් තිබිය යුතු අතර මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන මිශ්‍රණ සෑදීම, ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය පරීක්‍ෂා කිරීමේ හැකියාව සහ බහුවිධ පරීක්‍ෂණාගාර පරිපාලන කිරීමෙහිලා මනා දැනුමක් සහ පලපුරුද්දක් තිබීම; හෝ

* ද්‍රව්‍ය විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සමග උපාධි සුදුසුකම්වලින් පසුව මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන තාර මිශ්‍රණ යන්ත්‍ර පිළිබඳව සහ තාර මිශ්‍රණ තත්ව පරීක්‍ෂණ පිළිබඳව අවම වශයෙන් වසර දෙකක (2) පලපුරුද්දක් තිබිය යුතු අතර මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන මිශ්‍රණ සෑදීම, ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය පරීක්‍ෂා කිරීමේ හැකියාව සහ බහුවිධ පරීක්‍ෂණාගාර පරිපාලන කිරීමෙහිලා මනා දැනුමක් සහ පලපුරුද්දක් ලබා තිබිය යුතුයි.

* *ෆ්ලයින් ඔෆිසර්.*—සිවිල් ඉංජිනේරු ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී.)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්)/උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ) සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන තාර මිශ්‍රණ යන්ත්‍ර පිළිබඳව සහ තාර මිශ්‍රණ තත්ව පරීක්‍ෂණ පිළිබඳව අවම වශයෙන් වසර තුනක (3) අදාල ක්ෂේත්‍රයේ පලපුරුද්දක් ලබා තිබිය යුතුයි.

*ගොඩනැගිලි සේවා ඉංජිනේරු නිලධාරීන්* - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)

* *තාවකාලික ස්කොඩ්‍රන් ලීඩර්.*— සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සහ විද්‍යාපති (ගොඩනැගිලි සේවා ඉංජිනේරු) උපාධිය සමග වායුසමීකරණ,

ජල සැපයුම්, සනීපාරක්‍ෂක, මහජන සෞඛ්‍යය, ගිනි ආරක්‍ෂණය, විදුලි සෝපාන ආදී නව තාක්‍ෂණික ක්‍රමෝපායන් භාවිතයෙන් ගොඩනැගිලි නිර්මාණය/ඉදිකිරීම පිළිබඳව විද්‍යාපති උපාධියෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක(2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

*වාස්තු විද්‍යාඥයන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

* තාවකාලික ස්කොඩ්‍රන් ලීඩර් : වරලත් වාස්තු විද්‍යාඥ සුදුසුකම් ලබා තිබීම.

* ෆ්ලයිට් ලෙප්ටිනන්ට් :Msc (Arch) උපාධිය හෝ මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද B Arch උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

*ප්‍රමාණ සමීක්‍ෂක නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

* ෆ්ලයිට් ලෙප්ටිනන්ට් : මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද BSc in (QS) උපාධිය හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්‍ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Graduate Member) සමග සාමාජිකත්වයෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්‍ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම සමග සාමාජිකත්වයෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර තුනක (3) පළපුරුද්දක් ලබා තිබීම.

* ෆ්ලයින් ඔෆිසර් : ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්‍ෂකයින්ගේ ආයතනයේ සාමජිකත්වය (Technical Member) ලබා තිබීම හෝ රත්මලාන UNIVOTEC ආයතනයේ සම්පූර්ණයෙන් නිමකරන ලද ප්‍රමාණ සමීක්‍ෂක ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම සමග ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබීම.

*මිනින්දෝරුවන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)*
ෆ්ලයිට් ලෙප්ටිනන්ට් : සබරගමුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද මින්දෝරු විද්‍යාවේදී උපාධිය හෝ දියතලාව මිණුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයෙන් පිරිනමන ලද උපාධිය ලබා තිබීම.

* ෆ්ලයින් ඔෆ්සර් : දියතලාව මිණුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයෙන් පිරිනමන ලද මිනින්දෝරු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ආ) *වෛද්‍ය ශාඛාව*

*වෛද්‍ය නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

* ෆ්ලයිට් ලෙප්ටිනන්ට් : පිළිගත් විශ්ව විද්‍යාලයක වෛද්‍ය (එම්. බී. බී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතු ය. තෝරාගනු ලබන අපේක්‍ෂකයින් මූලික වශයෙන් සපුගස්කන්ද පිහිටි ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ සේවයෙහි යොදවනු ලැබේ.

(ඇ) *පාලන වෛද්‍ය ශාඛාව*

*භෞතචිකිත්සකයින් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

* ෆ්ලයිට් ලෙප්ටිනන්ට් : පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතචිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(ඈ) *දන්ත වෛද්‍ය ශාඛාව*

*දන්ත වෛද්‍ය නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

ෆ්ලයිට් ලෙප්ටිනන්ට් : පිළිගත් විශ්ව විද්‍යාලයක දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

*පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)*

* BDS (ශ්‍රී ලංකා) හෝ විදේශ දන්ත වෛද්‍ය විද්‍යාලයකින් සමත් වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි BDS (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්‍යයෙන්ම ලබා තිබිය යුතු ය. සුදුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් ස්වේච්ඡා අධිකාරිලත් නිළධාරීන් ලෙස බඳවාගනු ලැබේ. බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුළත ERPM විභාගය සමත් වී ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබාගත යුතු ය. එසේ වෛද්‍යවරයෙකු ලෙස ස්ථිරව ලියාපදිංචි වීමට අපොහොසත් වන නිළධාරීන්ගේ සේවය අවුරුදු පහකට (5) පසු අත්හිටුවනු ලැබේ.

* තෝරාගනු ලබන අයදුම්කරුවන් ෆ්ලයින් ඔෆිසර් නිලයෙහි අධිකාරිලත් නිළධාරීන් ලෙස බඳවා ගනු ලබන අතර ERPM විභාගය සමත්වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචියෙන් පසු ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලය ලබාදීම පිළිබඳව සලකා බලනු ලැබේ.

*දන්ත වෛද්‍ය ශිෂ්‍යයන් - පිරිමි/කාන්තා (නිත්‍ය)*

* පයිලට් ඔෆිසර් : බී. ඩී. එස් දෙවැනි කොටස සම්පූර්ණ කර දැනට තුන්වන වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන්හට මේ සඳහා අයදුම් කල හැක.

* ෆ්ලයින් ඔෆිසර් : අවසාන බී. ඩී. එස්. පළමු කොටස සම්පූර්ණ කර දැනට අවසන් වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන්හට මේ සඳහා අයඳුම් කල හැක.

***සැළකිය යුතුයි :***

(1) තෝරාගනු ලබන දන්ත වෛද්‍ය ශිෂ්‍ය අයදුම්කරුවන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබූ දින සිට වසර දහයක (10) අනිවාර්‍ය සේවයකට යටත් කරනු ලැබේ.

(2) තෝරාගනු ලබන දන්ත වෛද්‍ය සිසුන් අවසන් වසර සම්පූර්ණ කරන තුරු ගුවන් හමුදාවෙන් නිදහස් කරනු ලැබේ. දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව ඔවුන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(3) පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු සඳහා සේවා අවශ්‍යතාවයන් මත අවස්ථාවක් දෙනු ලැබේ.

(4) දන්ත වෛද්‍ය සිසුන් තම විශ්ව විද්‍යාලයේ අධ්‍යයන වසර තහවුරු කර ගත හැකි ලියවිල්ලක් අයඳුම්පත සමග එවිය යුතු ය.

(ඉ) *පාලන නීති ශාඛාව :*

*නීති නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

* ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම, වාණිජ ගිවිසුම්, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය, අධිකරණ නඩු මෙහෙයවීම සහ විනය පරීක්ෂණ පිළිබඳ විශේෂඥතාවය සහ/හෝ පළපුරුද්ද.

* වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත තෝරාගනු ලබන අයදුම්කරුවන් බලපත්‍රිත ලුතිනන් හෝ බලසණ නායක නිලයන්හි අධිකාරියට පත් කරනු ලැබේ.

3. *අනෙකුත් සුදුසුකම් :*

(අ) *පුරවැසිභාවය :* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය ;
(ආ) *සිවිල් තත්වය :* විවාහක/අවිවාහක ;
(ඇ) *ස්ත්‍රී පුරුෂ භාවය :* පිරිමි/කාන්තා (අදාළ පරිදි)
(ඈ) වයස : 2013 ඔක්තෝබර් මස 15 වැනි දිනට;

*(1) ගුවන් තොටුපළ නිර්මාණ, වෛද්‍ය, දන්ත වෛද්‍ය (දන්ත වෛද්‍ය නිලධාරීන්, පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන්) සහ පාලන නීති ශාඛාවන්වල අපේක්ෂකයින් සඳහා : අවුරුදු 18 සිට 35 දක්වා*

*(2) පාලන වෛද්‍ය (භෞතචිකිත්සකයින්) සහ දන්ත වෛද්‍ය (දන්ත වෛද්‍ය ශිෂ්‍යයන්) ශාඛාවන්වල අපේක්ෂකයින් සඳහා : අවුරුදු 18 සිට 30 දක්වා*

(ඉ) *උස :* පිරිමි - අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතු ය;
කාන්තා - අඩි 5 අඟල් 4 ක් හෝ ඊට වැඩි විය යුතු ය ;
(ඊ) *බර :* ශරීර ස්කන්ධ දර්ශකය ගුවන් හමුදා ශාරීරික නිපුණතා පරීක්ෂණ ප්‍රමිතියට අදාළව විය යුතුයි. :

(උ) *පපුව :* අඟල් 32ට නොඅඩු විය යුතුයි (පිරිමි);
(ඌ) *වර්ණ දෘෂ්ටිය :* සීපී2;
(එ) *දෘෂ්ටි තීක්ෂණත්වය :* වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව).

4. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා.—* තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නා වූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතු ය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයිට් ඔෆිසර්/ෆ්ලයිට් ලෙප්ටිනන්ට් /ස්කොඩ්‍රන් ලීඩර් යන නිලයන්හි නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතු ය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේ ය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක". කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතු ය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15(ඈ)(17) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :

පයිලට් ඔෆිසර් - රු. 2,42,700 වසරකට
ෆ්ලයිට් ඔෆිසර් - රු. 2,75,220 - 34 x 7,740 = රු. 5,38,380 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන්ට් - රු. 3,21,660 - 28 x 7,740 = රු. 5,38,380 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 3,52,620 - 24 x 7,740 = රු. 5,38,380 වසරකට
විංග් කමාන්ඩර් - රු. 3,62,100 - 20 x 9,480 = රු. 5,51,700 වසරකට
ග්‍රෑප් කැප්ටන් - රු. 4,41,060 - 18 x 12,600 = රු. 6,67,860 වසරකට

(ආ) වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 3,13,920 - 2 x 7,740 = රු. 3,29,400 වසරකට
2 වැනි ශ්‍රේණිය - රු. 3,37,140 - 8 x 7,800 = රු. 3,99,540 වසරකට
1 වැනි ශ්‍රේණිය - රු. 4,12,140 - 15 x 12,600 = රු. 6,01,140 වසරකට.
විශේෂ ශ්‍රේණිය - රු. 5,08,680 - 12 x 15,720 = රු. 6,97,320 වසරකට.

(ඇ) දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 3,06,180 - 3 x 7,740 = රු. 3,29,400 වසරකට
2 වැනි ශ්‍රේණිය - රු. 3,37,140 - 8 x 7,800 = රු. 3,99,540 වසරකට
1 වැනි ශ්‍රේණිය - රු. 4,12,140 - 15 x 12,600 = රු. 6,01,140 වසරකට.
විශේෂ ශ්‍රේණිය - රු. 5,08,680 - 12 x 15,720 = රු. 6,97,320 වසරකට.

(ඈ) අනෙකුත් දීමනා වෛද්‍ය/දන්ත වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා

(1) *විශ්‍රාම හිමි වැටුප් දීමනා* -

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 3,400 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 3,400 (මසකට) |

(2) *විශ්‍රාම වැටුප් රහිත දීමනා* -

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 2,125 (මසකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 400 (මසකට) |

(3) අමතර රාජකාරි දීමනාව - රු. 25,000 (මසකට)

(4) *අතිරේක රාජකාරි දීමනාව* -

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 335 0 (පැයකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 383 0 (පැයකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 528 0 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 628 0 (පැයකට) |

(5) (15) (ඈ) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඉ) *අනෙකුත් දීමනා* :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 6,600 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාත්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,400ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.).
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.
(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා).
(9) ආහාර දීමනාව මසකට රු. 14,449.80 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා).
(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(11) විශේෂ දීමනාවක් ලෙස මසකට මූලික වැටුපෙන් 17.5% මුදලක් ගෙවනු ලැබේ.
(12) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(13) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(14) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි).
(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(17) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන්හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමි වේ. පයිලට් ඔපිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා.
(18) සේවා දීමනා මාසිකව රු.300, රු.400, රු. 500 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)
(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500 (වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි.)
(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණි)
(21) අමතර රාජකාරී ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස්* :–

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2013 අගෝස්තු මස 23 වැනි දින මධ්‍යහ්න 1200ට හෝ ඊට පෙර ලැබෙන සේ "විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "................... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතු ය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතු ය.

(ඇ) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතු ය :
(1) උප්පැන්න සහතිකය;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික;
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

**සැලකිය යුතුයි*.- මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේ නම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරාගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :–*

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

එච්. ඩී. අබේවික්‍රම,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

***ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ………. ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත***

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ඉල්ලුම් කරන ශාඛාව :————.

5. ඉල්ලුම් කරන තනතුර :————.

6. ස්ථිර ලිපිනය :————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

8. තැපැල් ලිපිනය :————.

9. විද්‍යුත් ලිපිනය :————.

10. උපන් දිනය :————.

11. උස : අඩි :———— අඟල් :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම සේවක කොට්ඨාසය සහ අංකය :————.

15. දුරකථන අංකය :————.

16. විවාහක හෝ අවිවාහක බව :————.

17. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ/ විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) : | | |
| | අ.පො.ස. (උ.පෙළ) : | | |
| | වෘත්තීය සුදුසුකම් : | | |
| | වෙනත් : | | |

18. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තරඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

19. මව්පියන් පිළිබඳ විස්තර ඃ-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැනට ලිපිනය* |
|---|---|---|---|
| පියා :- | | | |
| මව :- | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

21. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

22. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

23. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

24. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

25. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

26. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

27. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

28. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

08-552

---

## ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### ගොවිජන විනිශ්වය සභා පත්කිරීම - 2013/2016

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

වසර 03ක කාලයක් සඳහා ගොවිජන විනිශ්චය සභා 25ක් පත් කිරීම වෙනුවෙන් 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වන මා විසින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව අයදුම්කරු විසින් පිළියෙල කරගත් අයදුම්පත් 2013 සැප්තැම්බර් මස 18 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ගොවිජන විනිශ්චය සභා" යනුවෙන් සඳහන් කල යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව මා වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග ලිපිලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

සැ. යු. -ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල නොකළ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය ඃ

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ.

03. වයස් සීමාව ඃ

අයදුම්කරු වයස අවුරුදු 70 නොඉක්මවූ අයකු විය යුතුය.

04. සුදුසුකම් ඃ

1. අවුරුදු 7කට වඩා පළපුරුද්ද සහිත විශ්‍රාමික විනිසුරුවරයකු.

2. ගොවිජන සේවා ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 7ක සේවා කාලයක් සහිත විශ්‍රාමික රාජ්‍ය නිලධරයකු.

05. බඳවා ගනු ලබන සංඛ්‍යාව ඃ

25 දෙනකු

06. බඳවා ගනු ලබන කාල සීමාව
වසර 03ක් සඳහා

07. (අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

08. පහත සඳහන් ලිපිලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටි විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකි විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) සේවා සහතික;
(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(ඈ) සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතික.

09. මෙම තනතුර සඳහා බඳවා ගන්නා නිලධාරීන් ලංකාවේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

10. මෙම තනතුර සඳහා මාසික රු. 28,740ක දීමනාවක් සහ රු. 5,000 ක මාසික අමතර ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.

එම්. ඒ. එස්. වීරසිංහ,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2013 ජූලි මස 26 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

***ආදර්ශ අයදුම්පත***

*ගොවිජන විනිශ්චය සභාව සඳහා පත්කිරීම*

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

1. සම්පූර්ණ නම :————.
2. මුලකුරු සමඟ නම :————.
3. ස්ථිර පදිංචිය :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
6. වයස අවු. :————. මාස :————. දින :————.
7. ජාතිය :————.
8. ආගම :————.
9. විවාහක/අවිවාහක බව :————.
10. ජා. හැ. ප. අංකය :————.
11. දුරකථනය අංකය :————.
12. අධ්‍යාපන සුදුසුකම් :————.
13. සේවා පළපුරුද්ද :————.
14. වෘත්තීය සුදුසුකම් :
15. කියවීමට, ලිවීමට සහ කථාකිරීමට හැකි භාෂාවන් ඃ
(අදාල කොටුවේ ( ✓ ) යොදන්න)

| | *කියවීම* | | | *ලිවීම* | | | *කථාකිරීම* | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | *විශිෂ්ටයි* | *හොඳයි* | *දුර්වලයි* | *විශිෂ්ටයි* | *හොඳයි* | *දුර්වලයි* | *විශිෂ්ටයි* | *හොඳයි* | *දුර්වලයි* |
| සිංහල | | | | | | | | | |
| දෙමළ | | | | | | | | | |
| ඉංග්‍රීසි | | | | | | | | | |

16. ගොවිජන සංවර්ධන නීතිය පිළිබඳ දැනීමක් තිබේද? ඔව්/නැත
ඔව් නම්, එම දැනුම ලබාගත් ආකාරය :————.
17. ඔබ විශ්‍රාමික විනිසුරුවරයෙක්ද? නැතහොත් විශ්‍රාමික රජයේ නිලධාරියෙක්ද?
(අදාල කොටුවේ ( ✓ ) යොදන්න.)

| | | |
|---|---|---|
| 01 | විශ්‍රාමික විනිසුරුවරයෙක් | |
| 02 | විශ්‍රාමික රජයේ නිලධාරියෙක් | |

18. සේවා තොරතුරු ඃ

| *සේවාව* | *රැකියා කාලය* | | *දරන ලද තනතුර* | *සේවා ස්ථානය* |
|---|---|---|---|---|
| | *සිට* | *දක්වා* | | |
| | | | | |
| | | | | |
| | | | | |

19. දේපලවල වටිනාකම : රු.————.

20. මාසික ආදායම : රු.————.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේද? :————.

22. ආදායම් බදු ගෙවන්නෙක්ද? :————.

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබේද? :————.

කිසියම් අධිකරණයකින් අපරාධ නඩු සඳහා ඔබව වරදකරු කර තිබේද? :————.

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :————.

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වගකිව යුතු පුද්ගලයන් විය යුතුය.)

(1)
නම :————.
ලිපිනය :————.
රක්ෂාව :————.
දුරකථන අංකය :————.
ඔබ දැන සිටින කාලය :————.

(2)
නම :————.
ලිපිනය :————.
රක්ෂාව :————.
දුරකථන අංකය :————.
ඔබ දැන සිටින කාලය :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.
*සටහන* : (සියළුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.)

08-569

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2013

2014/2016 අධ්‍යයන වර්ෂය සඳහා සත්ත්ව පාලන දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දෑවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාවේ 2014/2016 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් 2013 ඔක්තෝබර් මස මහනුවරදී පවත්වනු ලබන අතර, ඒ සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව* :

2.1 මෙම පාඨමාලාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

2.2 මෙම පුහුණුව හුදෙක්ම වෘත්තිමය සුදුසුකම් ලබා දීමක් පමණක් වේ. (රජයේ රැකියාවක් ලබාගැනීම සඳහා මෙම වෘත්තීය සුදුසුකම අමතරව, එම තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අනෙකුත් සුදුසුකම් ද සපුරා තිබීම අත්‍යාවශ්‍ය වේ.)

2.3 පාඨමාලාව හදාරන කාලය තුළදී සිසුන්ට දෛනිකව නේවාසික දීමනාවක් ලබාදෙන අතර, අමතරව අවශ්‍ය වන මුදල් සිසුන් විසින් සපයා ගත යුතු ය.

2.4 සෙනසුරාදා හා ඉරිදා යන දිනවල ද සමහරවිට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාර වලින් බැහැරව යවන්නේ මසකට එක් සති අන්තයක දී පමණි.

03. *ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්* :

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය යන විෂයයන් තුනෙන් එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතු ය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙ.) සමත් වී

තිබිය යුතු ය. මෙහි දී එක් වරක දී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05ක් සමත් වී තිබීම.

සහ

අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යා යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වී තිබීම. මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ 3.1(අ) හි අයදුම්කරුවන් සියලුම දෙනා තෝරා ගැනීමෙන් පසුව පුරප්පාඩු ඇතොත් පමණි.

(ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම් අ. පො. ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර, අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සමත්වී තිබිය යුතු ය.

3.2 2013.09.16 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවු. 17ට නොඅඩු විය යුතු අතර, අවු. 25ට වැඩි නොවිය යුතුය.

3.3 3.1 හා 3.2හි සඳහන් ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් සැලකිලිමත්ව කියවා බැලීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැරවන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයදුම්කරුවන් අයදුම්පත් එවීම නොකළ යුතු ය. රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක දෑඅවුරුදු සත්ත්ව පාලන පාඨමාලාවක් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 සියලුම අයදුම්කරුවන් 5.2 යටතේ වන ලිඛිත ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතු අතර, අයදුම්කරුවන් ඇතුළත් කරගැනීමේ විභාගයට පෙනී සිටිය යුත්තේ ද තමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යයෙනි.

3.6 මෙයට අමතරව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් 5.2.1 යටතේ වන විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

04. *අයදුම්පත්*

4.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් පිළියෙල කරගත යුතු ය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 විභාග ගාස්තුව රු. 150 කි. අපේක්ෂකයා විසින් තැපැල් කාර්යාලයකින් ලබා ගත් රු. 150 ක මුදල් ඇණවුමක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමින් ලබාගෙන මාරු කරගන්නා තැපැල් කාර්යාලය, පේරාදෙණිය වශයෙන් සඳහන් කර අයදුම්පත්‍රයක් සමඟ අදාළ ස්ථානයේ දාරය පමණක් ඇලවිය යුතු ය. තව ද මුදල් ඇණවුමේ ඡායා පිටපතක් ලඟ තබාගැනීමට කටයුතු කරන්න. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වන මුදල් ඇණවුම අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම්දීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2013.09.16 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙනසේ, අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතු ය.

4.4 අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "2014/2016 සත්ත්ව පාලන විද්‍යාලයට ඇතුළත්වීම" යන්න සඳහන් කරන්න.

4.5 අයදුම්පත්‍රයට අධ්‍යාපන සහතිකවල පිටපත් හා උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය. ඉල්ලා ඇති සහතිකවල පිටපත් අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

*බඳවා ගැනීම :*

5.1 පුහුණුවන්නන් තෝරාගනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5.2 ලිඛිත පරීක්ෂණය සඳහා වූ විෂයය නිර්දේශය පහත පරිදි වේ. :-

(i) සත්ත්ව පාලනය - අ. පො. ස. (සාමාන්‍ය පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශයේ සත්ත්ව පාලන කොටසට අදාළව සකස් කරන බහුවර්ණ කෙටි ප්‍රශ්න අඩංගු වේ. - කාලය පැය 01 යි.

(ii) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි.

5.2.1 ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය අ. පො. ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂයය නිර්දේශය ඇසුරින් සකස් කෙරේ. - කාලය පැය 01 යි.

5.3 ලිඛිත විභාගය හෝ සම්මුඛ පරීක්ෂණය හෝ ඒ දෙකටම/හෝ පෙනීසිටීම වෙනුවෙන් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් රජය මගින් ගෙවනු නොලැබේ.

5.4 විභාගය පැවැත්වෙන අවස්ථාවේ අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

5.5 යම් අයදුම්කරුවකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බව තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ ශිෂ්‍යභාවය වහාම අත්හිටුවනු ලැබීමට යටත්වනු ඇත. එලෙසම පුහුණු පාඨමාලාව ආරම්භ කර මසකට පසු ඉවත්ව යන සිසුන්ගෙන් ඔහුගේ/ඇයගේ පුහුණුව සඳහා රජය මගින් ඒ වන විට දරා ඇති සියළු වියදම් ගෙවීමට ඔහු බැඳී සිටින්නේ ය. වියදම් ප්‍රමාණය

තීරණය කිරීමේ අයිතිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවන්නේ ය.

වෛද්‍ය ඩබ්ලිව්. කේ. ද සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

2013 අගොස්තු මස 01 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය.

**ඉල්ලුම් පත්‍රය**

***සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව***
***ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය***
***සත්ත්ව පාලන දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව (2014/2016)***

විභාගයට පෙනී සිටීමට කැමැති මාධ්‍යය : ☐☐☐

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

02. භාවිතයේ යෙදෙන අයුරු මුලකුරු සමග නම :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. ලිපිනය :————.

05. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය :————.
දිස්ත්‍රික්කය :————.

06. උපන්දිනය : අවුරුද්ද :——. මාසය :——. දිනය :——.

07. 2013.09.16 වැනි දිනට වයස : අවුරුදු :——. මාස :——. දින :——.

08. දුරකථන අංකය :————.

09. ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සාමාන්‍ය පෙළ)

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/ විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |
| 07. | | | |
| 08. | | | |
| 09. | | | |
| 10. | | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ)

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.)

10. මුදල් ගෙවූ තැපැල් කාර්යාලය හා මුදල් කුවිතාන්සි අංකය :————.
(මුද්ල ඇණවුම ගලවා ගත හැකිවන පරිදි අමුණන්න)

11. අවසන්වරට අධ්‍යාපන ලැබූ පාසල්/ආයතනය :————.

12. පාසලෙන්/ආයතනයෙන් අස්වූ දිනය :————.

13. සත්ත්ව පාලනය පිළිබඳ දැනට යම් පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර (සහතික පිටපත් ඇමිණිය යුතුය.) :————.

14. ග්‍රාම සංවර්ධන/කෘෂිකාර්මික/සමාජසේවා/ක්‍රීඩා පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය.) :————.

15. අයදුම්කරු පිළිබඳ විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

1. ————.
2. ————.

ඉහත දැක්වෙන විස්තර මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍යවූ ද, නිවැරදිවූ තොරතුරු බව මගේ සුපුරුදු අත්සන තබා මෙයින් සහතික කරන අතර, යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරාගත් පසු අසත්‍ය තොරතුරක් හෙළදරව් වුවහොත්, මගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බව ද, පුහුණුව ලබන කාලයේ දී මා වෙනුවෙන් රජයට යම් මුදලක් ද ගෙවීමට සිදුවී නම්, එම මුදල ගෙවීමට ද මම බැඳී සිටින බව ද දන්වමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන : මෙම අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කරන සහතික පිටපත් ලේඛණ

1. ————.
2. ————.

08-626